SLFRS 16 කල්බදු

සංදීප ජයසේකර

Co-ordinating office | JMC Jayasekera Management Centre (Pvt) Ltd No 65/2A, Sir Chittampalam A Gardiner Mw, Colombo 02
Tel : 011 2 430451 | Mob : 071 488 4622, 071 415 0400 | Web : www.jmc.lk

1

සංදීප ජයසේකර

- උසස් පෙළ වාණිජ විෂයය මාධ්‍යයෙන් ශ්‍රී ලංකාවේ 11 වෙනියා ලෙසත් කොළඹ දිස්ත්‍රික්කයේ 03 වෙනියා ලෙසත්
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ පළමු පෙළ උපාධිය සහ දක්ෂතම ශිෂ්‍යයාට හිමි රන් පදක්කම
- වරලත් ගණකාධිකාරීවරයෙකු (CA Sri Lanka)
- වරලත් ගණකාධිකරණ දෙවන අදියරේ ශ්‍රී ලංකාවේ ප්‍රථමයා ලෙසත්, අවසාන අදියරේ උසස් මූල්‍ය වාර්තාකරණ විෂයය ත්‍යාගය
- එංගලන්තයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු (CIMA-UK)
- වරලත් කළමනාකරණ ගණකාධිකාරී (CIMA-UK) අවසාන අදියරේ ශ්‍රී ලංකාවේ ප්‍රථමයා සහ ලෝකයෙන්ම 11 වෙනියා ලෙසින්

Sandeepa - JMC

2

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ (AAT Sri Lanka) සාමාජිකයෙකු
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA Sri Lanka) සාමාජිකයෙකු
- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) කළමනාකරණ පශ්චාත් උපාධියේ අවසන් අදියර
- JMC ජයසේකර කළමනාකරණ ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරී
- JMC ජාත්‍යන්තර පාසල් ජාලයේ ප්‍රධාන හවුල්කරුවෙකු
- JMC vLearning ඒකකයේ ප්‍රාරම්භකයා
- JMC කථිකාචාර්යවරයෙකු
- "ආවර්ජනයකට අවසරයි" නවකතාවක් ලියූ ලේඛකයෙකු
- පුහුණු සහ සංවර්ධන වැඩමුළු, අභිප්‍රේරණ දේශන 100කට අධික ප්‍රමාණයක් තුල දැනුම අත්දැකීම් බෙදාගන්නා දේශකයෙකු

සංදීප ජයසේකර

3

SLFRS 16 - කල්බදු
SLFRS 16 - Leases

Sandeepa Jayasekera - JMC 4

4

මේ ඉන්නේ කවිඳු

කවිඳුට කාරෙකක් ඕනි

කවිඳු බලන කාරෙක එක රු.5,000,000යි

හැබැයි කවිඳු අතේ තියෙන්නේ
රු.1,200,000ක් විතරයි



5



කවිඳුට කාරෙක ගන්න විදි 03ක් තිබ්බා

- **ඉතුරු කරලා**
  - ඉතුරු කරලා කාරෙක ගන්න සෑහෙන කාලයක් යයි
- **ණයක් අරන්**
  - ඉතුරු කරන තරම් කාලෙ ගියේ නැතත් බැංකු ණය ටිකක් කල් යනවා, ඇපකාරයෝ හොයන්නයි, එක එක ලියවිලි දෙන්නයි වගේ කරදර වැඩියි
- **කල්බද්දට**
  - කල්බද්දට ගන්න එක නම් ඉක්මන්, ලියවිලිත් අඩුයි

6

කවිඳු LB Finance එකට ගිහින්
කාරෙකට කල්බදු පහසුකමක් ඉල්ලුවා

LB Finance එක කිව්වා ඉතිරි
රු.3,800,000/- එයාල වාහන සේල්
එකට දෙන්නම් කියලා
හැබැයි අවුරුදු 5කින් රු.3,800,000/-
10%ක පොළියකුත් එක්ක ගෙවන්න
කිව්වා

බලන් ගියාම මේකත් ණයක් නේ
සල්ලි වලින් දෙන් නැතුව වාහනේට ගෙවපු

7

ඒ නිසා අවුරුදු 05 යනකන් වාහනේ
අයිතිය LB Finance එකේ නමට
තියෙන්න ඕනි කිව්වා
අයිතිය LB Finance එකට තිබ්බට
කවිඳුට පාවිච්චි කරන්න පුළුවන්
හැබැයි කවිඳු ගෙව්වේ නැති වුණොත්
LB Finance එකෙන් ඇවිත් එයාලා
ගාව තියන යතුර පාවිච්චි කරලා
වාහනේ උස්සනවා

ඔක්කොම ගෙවලා ඉවර වුණාම කවිඳුගේ නමට වාහනේ හරවා ගන්න
පුළුවන්
කවිඳු කැමති වෙලා වාහනේ ගත්තා

8

කවිඳු අවුරුදු 05 ඉවර වෙද්දි ගත්ත ණයට ඔක්කොම රු.5,000,000ක් ගෙවලා තිබ්බා

වැඩිපුර ගෙවලා තිබ්බ රු.1,200,000 කල්බදු පොළිය

ගිවිසුමේ හැටියට ඔක්කොම ගෙව්වට පස්සේ කවිඳුට කාරෙකේ අයිතියත් ආවා

9

LB Finance එක කාරෙක භාවිතා කරන්න තියන අයිතිය දුන්නා කවිඳුට

LB Finance

කාරෙකේ අයිතිකාරයා

කල්බදු දීමනාකරු

වසර 05ක ගිවිසුමක්

කවිඳු

කාරෙක පාවිච්චි කරන කෙනා

කල්බදු ගැණුම්කරු

කවිඳු ඒ වෙනුවෙන් කල්බදු වාරික ගෙව්වා

10

මේ ඉන්නේ විජිනි

එයා මේ දවස් වල ගෙයක් කුළියට ගන්න හොයනවා

මේ ඉන්නේ ශළින

එයා මේ ගෙදර කුළියට දෙන්න ඉන්නේ

11

ශළින කැමති වෙනවා ගෙදර විජිනිට කුළියට දෙන්න

ශළිනයි විජිනියි ගෙවල් කුළී ගිවිසුමක් අත්සන් කරනවා!

12


ශළින ගෙදර භාවිතා කරන
අයිතිය දෙනවා විජිනිට
කුළී ගිවිසුම අවුරුදු 05යි
විජිනි ඒ වෙනුවෙන් ගෙවල්
කුළී ගෙවනවා
ශළින
ගෙදර අයිතිකාරයා
කුළී දීමනාකරු
විජිනි
කුළියට ගත්ත කෙනා
කුළී ගැනුම්කරු
Sandeepa Jayasekera - JMC

13


කල්බදු
වත්කමේ භාවිතය
පාලනය
කිරීමේ අයිතිය
කල්බදු දීමනාකරු
වත්කමක් කුළියට දීම
කල්බදු ගැනුම්කරු
ප්‍රතිශ්ඨාව
(කල්බදු වාරික)
වත්කමේ අයිතිකරු
කුළියට දුන් පාර්ශවය
පාරිභෝගිකයා
කුළියට ගත් පාර්ශවය

14

කල්බදු ගිණුම්කරණය
පියවර 01
ගිවිසුමක් තුළ කල්බද්දක් ඇතුලත් වේ දැයි හඳුනාගැනීම

15

ගිවිසුමක් තුළ කල්බද්දක් ඇතුලත් වේ දැයි හඳුනාගැනීම

16

කල්බදු ගිණුම්කරණය
පියවර 02
නිදහස්වීම් -
කල්බදු ගිණුම්කරණය නොකර සිටිය හැකි අවස්ථා

17



18

උපස කල්බදු කරනවා කියන්නේ?

ප්‍රශ්න 01

නාමල් සමාගම 20X1/01/01 ඡායා පිටපත් යන්ත්‍රයක් මාස 08 කාලයක් සඳහා කල්බදු පදනමක් යටතේ ලබා ගන්නා ලදී.

සමස්ත කල්බදු වියදම රු.80,000 ක් වු අතර ඒ ගිවිසුමට එළඹුණු දිනයේදීම ගෙවා නිම කරන ලදී.

ගිණුම් වර්ෂය 20X1/03/31 අවසන් වන්නේ නම් ගිණුම් සටහන් දක්වන්න.

ඉදිරියට කළ කල්බදු වියදම

මුදල් ගිණුම

කල්බදු කුළි වියදම් ගිණුම

ප්‍රශ්න 02

ඩිල්කි සමාගමේ කල්බදු ගිවිසුම් යටතේ පහත වත්කම් ලබාගෙන ඇත

ඒ අතුරින් අඩු වටිනාකම් කල්බදු හඳුනාගන්න.

වත්කම	අඩු වටිනාකම් කල්බද්දක්ද?
මෝටර් රථය	
කාර්යාල ගොඩනැගිල්ල	
කාර්යාල පරිගණකය	
තවත් ආයතනයකට උපකල්බදු කර ඇති ඡායා පිටපත් මුද්‍රණ යන්ත්‍රය	
ජංගම දුරකථනය	

කල්බදු ගිණුම්කරණය
පියවර 03
කල්බදු ගැනුම්කරුගේ පොත් වල ගිණුම් තැබීම

23

දිගුකාලීන ණයක් යටතේ වත්කමක් අත්පත් කරගැනීමකට සමාන වේ

- කල්බදු වගකීම
- වත්කමේ භාවිත අයිතිය

24

කල්බදු වගකීම යනු

කල්බදු ණයහිමියාට

ගෙවීමට බැඳී ඇති අගයේ

වර්තමාන වටිනාකම

25

මුදලේ කාල අගය තේරුම් ගමු

රු 100/-ක් අද ලැබෙනවාටද අවුරුද්දකට පසුව ලැබෙනවාටද ඔබ කැමති?

අද ලැබෙනවාට ඔබ කැමති!

හේතු

1. අද එය ලැබුණොත් ඔබට එය ආයෝජනය කර ආදායමක් උපයා ගත හැකිය
2. අද රු 100/- කින් ගත හැකි භාණ්ඩ හා සේවා එම මිලටම අවුරුද්දකට පසුව මිලදී ගත නොහැකිය
3. අද මුදල ලැබුණොත් එය නිශ්චිතය. අවුරුද්දකට පසුව මුදල ලැබීම අවිනිශ්චිතය

26

එසේ නම් යම් මුදලක් අනාගතයේ ලැබෙන්නේ නම්

අහිමි වන ආයෝජන ආදායමට - **ආවස්ථික පිරිවැය**

මූර්ත අගය පහල යැමට - **උද්ධමනය**

අවිනිශ්චිතතාවට

වන්දියක් ලෙස **පොළියක්** බලාපොරොත්තු වේ

වර්තමාන මුදල් ප්‍රවාහ + පොළිය = අනාගත මුදල් ප්‍රවාහ

27

අනාගත මුදල් ප්‍රවාහ තුල ඇතුළත් **පොළිය ඉවත් කිරීම වට්ටම් කිරීම** ලෙස හඳුන්වයි

අනාගත මුදල් ප්‍රවාහය × වට්ටම් සාධකය = වර්තමාන මුදල් ප්‍රවාහය

$$\text{වට්ටම් සාධකය} = \frac{1}{1 + r \,\hat{}\, n}$$

r = පොළී අනුපාතය

n = කාලය

28

ප්‍රශ්න 03

පහත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන් ගණනය කරන්න

(පොළී අනුපාතය 10% යැයි උපකල්පනය කරන්න)

වසර	අනාගත මුදල් ප්‍රවාහය	වට්ටම් සාධකය	වර්තමාන අගය	පොළිය
	A	B	C = A*B	D = A - C
0	100	1		
1	110	0.91		
2	121	0.83		
3	133	0.76		

29

29

කල්බදු වගකීම මූලික මිණුම්කරණය



30

30

කල්බදු වගකීම පසුකාලීන මිණුම්කරණය

ආරම්භක කල්බදු වගකීම + කල්බදු පොළිය − වාරික ගෙවීම් = අවසාන කල්බදු වගකීම

කල්බදු පොළිය =

කල්බදු පොළී අනුපාතය

×

කාලච්ඡේදය ආරම්භයේ කල්බදු වගකීම් ශේෂය

31

31

වත්කම භාවිත අයිතිය යනු

- කල්බදු කාලය තුල
- වත්කමේ භාවිතය පාලනය කිරීමට
- කල්බදු ගැනුම්කරුට ලැබෙන
- අයිතිය

Sandeepa Jayasekera - JMC

32

32


වත්කමේ භාවිත අයිතිය මූලික මිණුම්කරණය
කල්බදු වගකීමේ මූලික මිණුම්කරණය
මූලික තැන්පතු ගෙවීම්
ආරම්භක සෘජු පිරිවැය
ගිවිසුම අවසානයේ වත්කම ගලවා ඉවත් කිරීමට වුවහොත් යන ඇස්තමේන්තුගත වියදම
33

33


වත්කමේ භාවිත අයිතිය ක්ෂය කිරීමට අදාළ නීතිය
ඔව්
ප්‍රයෝජනවත් ජීව කාලය පුරාවට
ගිවිසුම අවසානයේ වත්කමේ හිමිකම පැවරෙන්නේද?
ප්‍රයෝජනවත් ජීව කාලය පුරාවට
අඩු අගය
නැත
කල්බදු කාලය
34

34

වත්කම භාවිත අයිතිය පසුකාලීන මිණුම්කරණය

පිරිවැය ආකෘතිය	
පිරිවැය	XX
(-) සමුච්චිත ක්ෂය	(X)
(-) සමුච්චිත හානිකරණ අලාභ	(X)
ශුද්ධ පොත් අගය	XX

ප්‍රත්‍යාගණන ආකෘතිය	
ප්‍රත්‍යාගනිත අගය	XX
(-) පසුකාලීන සමු. ක්ෂය	(X)
(-) පසුකාලීන සමු. හානිකරණ අලාභ	(X)
ශුද්ධ පොත් අගය	XX

35

35

කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම

විස්තරය	ද්විත්ව සටහන
මූලික ගෙවීම	
වත්කම භාවිත අයිතිය ගිණුම	හර
මුදල් ගිණුම	බැර
කල්බදු වගකීම ලෙස හඳුනාගත් අගය	
වත්කම භාවිත අයිතිය ගිණුම	හර
කල්බදු වගකීම් ගිණුම	බැර

36

කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම

විස්තරය	ද්විත්ව සටහන
ආරම්භක සෘජු පිරිවැය ලෙස කරන ගෙවීම	
වත්කම භාවිත අයිතිය ගිණුම	හර
මුදල් ගිණුම	බැර
වාර්ෂික පොලිය	
පොලී වියදම් ගිණුම	හර
කල්බදු වගකීම් ගිණුම	බැර

37

කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම

විස්තරය	ද්විත්ව සටහන
කල්බදු වාරික ගෙවීම	
කල්බදු වගකීම් ගිණුම	හර
මුදල් ගිණුම	බැර
වත්කමේ ක්ෂය වීම	
ක්ෂයවීම් ගිණුම	හර
සමුච්චිත ක්ෂය ගිණුම	බැර

38

මූල්‍ය තත්ව ප්‍රකාශය තුල ඉදිරිපත්කිරීම



39

39

ලාභලාභ ගිණුම තුල ඉදිරිපත් කිරීම

ක්ෂය

කල්බදු පොළිය

Sandeepa Jayasekera - JMC

40

40

ප්‍රශ්න 04

සීමා සහිත LB ලීසිං සමාගමෙන්, 20X7.04.01 දින කවිඳු කල්බදු ගිවිසුමක් යටතේ කාරයක් ලබා ගත්තේය. එම ගිවිසුමට අනුව,

කල්බදු කාලසීමාව - වසර 5 කි මූලික තැන්පතුව - රු.1,200,000

ඉතිරි මුදල වාර්ෂික වාරිකයක් රු.1,000,000 බැගින් වාරික 5 කින් ගෙවිය යුතුය. වාරික සෑම වර්ෂයකම අගදී ගෙවිය යුතුය. විලදායී ජීවිත කාලයද අවුරුදු 5 ක් වේ.
නොගෙවූ කල්බදු ගෙවීමෙහි වර්තමාන අගය රු.3,800,000 ක් විය.

පොළී අනුපාතය - 10%

පළමු වාරිකය තුළ ඇතුළත් පොළිය රු.380,000 ක් වන අතර, දෙවන වාරිකය තුළ ඇතුළත් පොළිය රු.318,000 ක් වේ. කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය පැවරේ.

ඔබ විසින්,

20X8.03.31 දිනෙන් අවසන් වසරෙහි ගිණුම් සටහන් හා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ ලාභාලාභ ගිණුමේ උද්ධෘතයක් පෙන්වන්න

41

41

Sandeepa Jayasekera - JMC

42

42

පිළිතුරු 04

ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

වසර	මූලික ගෙවීම	කල්බදු වාරික	පොළිය 20%	ණය කොටස
0	1,200,000		0	
1		1,000,000	380,000	620,000
2		1,000,000	318,000	682,000
3		1,000,000		
4		1,000,000		
5		1,000,000		
එකතුව	1,200,000	5,000,000	1,200,000	3,800,000

43

43

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
මූලික ගෙවීම		
වත්කම භාවිත අයිතිය	1,200,000	
මුදල්		1,200,000
කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස)		
වත්කම භාවිත අයිතිය	3,800,000	
කල්බදු වගකීම		3,800,000
පළමු වාරිකය තුල ඇතුළත් පොළිය		
කල්බදු පොළිය	380,000	
කල්බදු වගකීම		380,000

44

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
පළමු කල්බදු වාරිකය ගෙවීම		
කල්බදු වගකීම	1,000,000	
මුදල්		1,000,000
පළමු වර්ෂයේ ක්ෂය		
ක්ෂය	1,000,000	
ක්ෂය වෙන්කිරීම		1,000,000

45

ක්ෂය ගණනය කිරීම

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/ඵලදායී ජීව කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/ඵලදායී ජීව කාලය]

ක්ෂය = [(5,000,000 - 0)/5]

ක්ෂය = 1,000,000

46

වත්කම භාවිත අයිතිය

මුදල්

කල්බදු වගකීම

කල්බදු පොළිය

ක්ෂය

ක්ෂය වෙන්කිරීම

ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශ උද්ධෘතය	රු
ජංගම නොවන වත්කම්	
වත්කම භාවිත අයිතිය	
ජංගම නොවන වගකීම්	
කල්බදු වගකීම	
ජංගම වගකීම්	
කල්බදු වගකීම	

49

ඉදිරිපත් කිරීම

ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය	රු
ක්ෂය	
කල්බදු පොළිය	

50

ප්‍රශ්න 05

සීමිත ලකීලෑන්ඩ් සමාගම නිෂ්පාදන යන්ත්‍රයක් කල්බදු ගිවිසුමක් යටතේ සීමිත පිපල්ස් ලීසිං සමාගම හරහා 20X1.04.01 දින අත්පත් කරගත් අතර නොගෙවූ කල්බදු ගෙවීමෙහි වර්තමාන අගය රු.1000,000ක් විය. කල්බදු ගිවිසුමට අනුව 20X1.04.01 දින රු.100,000 ගෙවිය යුතුයි. ඉතිරිය වාරිකයක් රු.400,000 ක් බැගින් වු වාර්ෂික වාරික 3 කින් ගෙවා නිම කළ යුතුයි. වාරික ගෙවීම සෑම වසරකම අග දින සිදුකළ යුතු අතර වාරික මත පොළිය ආරම්භක ණය අගය මත පදනම්ව වාර්ෂිකව 10% බැගින් විය.

20X1.04.01 දින යන්ත්‍රය ප්‍රවාහනය සහ සවි කිරීම සඳහා රු.100,000/-ක වියදමක් දරන ලදි.

කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත.

යන්ත්‍රයේ ඵලදායී ජිවිත කාලය වර්ෂ 4 කි.

ඔබ විසින්,

සීමිත ලකීලෑන්ඩ් සමාගමේ 20X1/20X2 වර්ෂයට අදාළ ගිණුම් සටහන් හා 20X2.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සහ ලාභාලාභ ගිණුමේ උද්ධෘතයක් පෙන්වන්න. 51

51

Sandeepa Jayasekera - JMC 52

52

පිළිතුරු 05

ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

වසර	මූලික ගෙවීම	කල්බදු වාරික	පොලිය 10%	ණය ප්‍රාග්ධන කොටස
0	100,000			
1		400,000	1,000,000X10% 100,000	400,000-100,000 300,000
2		400,000	(1,000,000-300,000)X10% 70,000	400,000-70,000 330,000
3		400,000		
එකතුව	100,000	1,200,000	200,000	1,000,000

53

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
මූලික ගෙවීම		
වත්කම භාවිත අයිතිය	100,000	
මුදල්		100,000
ආරම්භක සෘජු වියදම්		
වත්කම භාවිත අයිතිය	100,000	
මුදල්		100,000
කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස)		
වත්කම භාවිත අයිතිය	1,000,000	
කල්බදු වගකීම		1,000,000

54

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
පළමු වාරිකය තුල ඇතුළත් පොළිය		
කල්බදු පොළිය	100,000	
කල්බදු වගකීම		100,000
පළමු කල්බදු වාරිකය ගෙවීම		
කල්බදු වගකීම	400,000	
මුදල්		400,000
පළමු වර්ෂයේ ක්ෂය		
ක්ෂය	400,000	
ක්ෂය වෙන්කිරීම		400,000

55

ක්ෂය ගණනය කිරීම

ගිවිසුම අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත. ඒ අනුව වත්කමේ ඵලදායී ජීව කාලය වන අවුරුදු 04 සහ කල්බදු කාලය වන අවුරුදු 03 යන දෙකෙන් අඩු අගය වන කල්බදු කාලයට ක්ෂය කරන ලදි.

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/කල්බදු කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/කල්බදු කාලය]

ක්ෂය = [(1,200,000 - 0)/3]

ක්ෂය = 400,000

56

වත්කම භාවිත අයිතිය

මුදල්

කල්බදු වගකීම

57

කල්බදු පොළිය

ක්ෂය

ක්ෂය වෙන්කිරීම

58

ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශ උද්ධෘතය	රු
ජංගම නොවන වත්කම්	
වත්කම භාවිත අයිතිය	
ජංගම නොවන වගකීම්	
කල්බදු වගකීම	
ජංගම වගකීම්	
කල්බදු වගකීම	

59

ඉදිරිපත් කිරීම

ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය	රු
ක්ෂය	
කල්බදු පොළිය	

60

ප්‍රශ්න 06

සීමාසහිත කේසර සමාගම විසින් සම්පත් ලීසිං වෙතින් කල්බදු පදනමක් යටතේ යන්ත්‍රයක් ලබාගන්නා ලදි. 20X1.04.01 දින මූලික ගෙවීමක් ලෙස රු 200,000/-ක් ගෙවන ලදි. ඉතිරිය රු 400,000/- බැගින් වන වාරික 03 කින් ගෙවීමට එකඟ විය. පොළී අනුපාතය 10%කි.

වට්ටම් සාධක පහත පරිදි වේ

01 වසර 0.91

02 වසර 0.83

03 වසර 0.76

යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 2ක් වේ. ගිවිසුම අවසානයේ යන්ත්‍රයේ අයිතිය මාරු නොවේ. සමාගම විසින් යන්ත්‍රය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි. 20X2.03.31 දිනට යන්ත්‍රය ප්‍රත්‍යාගණන කරන ලද අතර ප්‍රත්‍යාගණන වටිනාකම රු.800,000/-ක් විය.

ඔබ විසින් ඉහත ගනුදෙනුව 20X2/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය තුල සහ 20X1/X2 වර්ෂයේ ලාභාලාභ ගිණුම තුල නිරූපණය කළ යුතු ආකාරය දක්වන්න 61

61

Sandeepa Jayasekera - JMC 62

62

පිළිතුරු 06

නොගෙවූ කල්බදු ගෙවීමේ වර්තමාන අගය ගණනය කරමු

වසර	අනාගත මුදල් ප්‍රවාහ	වට්ටම් සාධකය	වර්තමාන අගය
1	400,000	0.91	364,000
2	400,000	0.83	332,000
3	400,000	0.76	304,000
එකතුව	1,200,000		1,000,000

63

63

පිළිතුරු 06

ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

වසර	මූලික ගෙවීම	කල්බදු වාරික	පොළිය 10%	ණය කොටස
0	200,000			
1		400,000	1,000,000X10% 100,000	400,000-100,000 300,000
2		400,000	(1,000,000-300,000)X10% 70,000	400,000-70,000 330,000
3		400,000		
එකතුව	200,000	1,200,000	200,000	1,000,000

64

64

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
මූලික ගෙවීම		
වත්කම භාවිත අයිතිය	200,000	
මුදල්		200,000
කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස)		
වත්කම භාවිත අයිතිය	1,000,000	
කල්බදු වගකීම		1,000,000
පළමු වාරිකය තුල ඇතුළත් පොළිය		
කල්බදු පොළිය	100,000	
කල්බදු වගකීම		100,000

65

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
පළමු කල්බදු වාරිකය ගෙවීම		
කල්බදු වගකීම	400,000	
මුදල්		400,000
පළමු වර්ෂයේ ක්ෂය		
ක්ෂය	600,000	
ක්ෂය වෙන්කිරීම		600,000
ප්‍රත්‍යාගණිත වත්කමේ සමුච්චිත ක්ෂය වත්කම් ගිණුමට මාරු කිරීම		
ක්ෂය වෙන්කිරීම	600,000	
වත්කම භාවිතා කිරීමේ අයිතිය		600,000

66

ද්විත්ව සටහන්

විස්තරය	හර	බැර
ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්ගත කිරීම		
වත්කම භාවිතා කිරීමේ අයිතිය	200,000	
ප්‍රත්‍යාගණන සංචිත ගිණුම (වෙනත් විස්තීර්ණ ආදායම් හරහා)		200,000

67

ක්ෂය ගණනය කිරීම

ගිවිසුම අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත

ඒ අනුව වත්කමේ ඵලදායී ජීව කාලය වන අවුරුදු 02 සහ කල්බදු කාලය වන අවුරුදු 03 යන දෙකෙන් අඩු අගය වන ඵලදායී ජීව කාලයට ක්ෂය කරන ලදි

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/ ඵලදායී ජීව කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/ ඵලදායී ජීව කාලය]

ක්ෂය = [(1,200,000 - 0)/2]

ක්ෂය = 600,000

68

ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය ගණනය කිරීම

ප්‍රත්‍යාගණන අගය		800,000
(-) 20X2 03 31 දිනට වත්කමේ ධාරණ අගය		
වත්කම භාවිතා කිරීමේ අයිතිය පිරිවැය	1,200,000	
(-) සමුච්චිත ක්‍රමක්ෂය	(600,000)	(600,000)
ප්‍රත්‍යාගණන ලාභය		200,000

ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්ගත කිරීම

මෙම වත්කමට අදාළව පෙර වර්ෂයක ප්‍රත්‍යාගණන අලාභ නොමැති බැවින් සමස්ත ලාභය වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හරහා ප්‍රත්‍යාගණන සංචිතය තුල හදුනාගත යුතුය

69

වත්කම භාවිත අයිතිය

මුදල්

කල්බදු වගකීම

70

කල්බදු පොළිය

ක්ෂය

ක්ෂය වෙන්කිරීම

Sandeepa Jayasekera - JMC 71

71

ප්‍රත්‍යාගණන සංචිතය

Sandeepa Jayasekera - JMC 72

72

ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ව ප්‍රකාශ උද්ධෘතය	රු
ජංගම නොවන වත්කම්	
වත්කම භාවිත අයිතිය	
හිමිකම්	
ප්‍රත්‍යාගණන සංචිතය	
ජංගම නොවන වගකීම්	
කල්බදු වගකීම	
ජංගම වගකීම්	
කල්බදු වගකීම	

73

ඉදිරිපත් කිරීම

ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය	රු
ලාභාලාභ ගිණුම	
ක්ෂය	
කල්බදු පොළිය	
වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	
ප්‍රත්‍යාගණන ලාභය	

74

ප්‍රශ්න 04 - 2020 ප්‍රශ්න 01(vii)

ගොඩනැගිල්ලක භාවිත අයිතිය වසර 4 ක කාලයකට ලබා ගැනීම සඳහා 2020.03.01 දින සමාගම විසින් කල්බදු ගිවිසුමකට එළඹෙන ලදි. කෙසේ වුව ද අළුත්වැඩියාව සඳහා රු. 500 000 ක් වියදම් දැරීමෙන් පසු 2020.03.31 දින සිට මෙම ගොඩනැගිල්ල භාවිතය සඳහා යොදාගත හැකි විය. මෙම අළුත්වැඩියා කිරීම තුළින් මෙම කල්බදු කාලය තුළම සමාගමට ප්‍රතිලාභ ලැබේයැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුව ද මෙම මුදල වෙනත් පරිපාලන වියදම් තුළ ගිණුම්ගත කර ඇත. අළුත්වැඩියා කාලය තුළ කල්බදු පොලියක් අය කරනු නොලැබේ. ගිවිසුමට අනුව 2021.03.31 දින සිට රු. 4,413,000 ක වාර්ෂික කල්බදු වාරිකයක් ගෙවිය යුතු වේ.

ප්‍රශ්න 04 - 2020 ප්‍රශ්න 01(vii)

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ කල්බදු පොලිය රු. 1,890,000 කි. කල්බදු වගකීම (නොගෙවූ කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකම) සහ භාවිත අයිතිය සහිත වත්කම රු 12,600,000/-. පරිපාලන වියදම රු 6,462,000/-

මූල්‍ය ප්‍රකාශ උද්ධෘත තුල පෙන්වන ආකාරය දක්වන්න

77

78

ප්‍රශ්න 03 - 2019 ප්‍රශ්න 01(iv)

2018.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුනු අතර වසර 5 ක කාලයක් සඳහා මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගන්නා ලදි. 2018.04.01 දිනට මෝටර් රථයේ භාවිත අයිතියේ පිරිවැය සහ එහි ඵලදායි ජීව කාලය පිළිවෙළින් රු. 5 960 000 ක් සහ වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදි. කල්බදු ගිවිසුමට අනුව 2018.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 2 500 000 ක් ගෙවූ අතර 2019.03.31 දින ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු. 1 250 000 ක් ගෙවන ලදි.

ප්‍රශ්න 03 - 2019 ප්‍රශ්න 01(iv)

මූලික මිනුම් කිරීමේ දී කල්බදු වගකීම රු. 3 460 000 ක් විය. 2019.03.31 සහ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙළින් රු. 346 000 ක් සහ රු. 256 000 ක් වේ. සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම සහ ප්‍රථම කල්බදු වාරිකය පමණක් කල්බදු ගෙවීම් ගිණුමේ සටහන් කර තිබුණි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

මූල්‍ය ප්‍රකාශ උද්ධෘත තුල පෙන්වන ආකාරය දක්වන්න

81

82

හෙළිදරව් කිරීම්

- ක්‍රමක්ෂය
- පොළිය
- කල්බදු ගෙවීම්
- වත්කම භාවිත අයිතියේ ධාරණ අගය
- වත්කම භාවිත අයිතියට එකතු කිරීම්

83

83

දිවයින පුරා ව්‍යාප්ත JMC ශාඛා ජාලය

- ප්‍රධාන කාර්යාලය (0714150400)
- හැව්ලොක් ටවුන් (0718683480)
- මහරගම (0714115498)
- කඩුවෙල (0714150405)
- දෙමටගොඩ (0714884600)
- අංගොඩ (0718622682)
- කිරිබත්ගොඩ (0714884633)
- ගම්පහ (0714114794)
- නිට්ටඹුව (0714150404)
- මීගමුව (0714884631)
- කළුතර (0719762607)
- කෑගල්ල (0718622680)
- මහනුවර (0714884623)
- කුරුණෑගල (0714884619)
- පේරාදෙණිය (0710617624)
- අම්පිටිය (0714884602)
- කොත්මලේ (0714115505)
- පොළොන්නරුව (0712723668)
- රත්නපුර (0719179575)
- බණ්ඩාරවෙල (0714150399)

Co-ordinating office | JMC Jayasekera Management Centre (Pvt) Ltd No 65/2A, Sir Chittampalam A Gardiner Mw, Colombo 02
Tel : 011 2 430451 | Mob : 071 488 4622, 071 415 0400 | Web : www.jmc.lk

84